# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No   DSD/HO/MF/BR | ඔබේ අංකය<br>உமது இல<br>Your No ............ | දිනය<br>திகதி<br>Date   2017/05/22 |

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන් හා
බැංකු සමිති කළමණාකරුවන් වෙත

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු සහ බැංකු සමිති ලියාපදිංචි කිරිම.</u>**

ශිර්ෂ ගත කරුණ පිළිබඳව නිකුත් කල 2017/03/17 දිනැති ස.ප්‍ර.බැ.2017/06 චක්‍රලේඛ උපදෙස් හා බැදේ.

එම ලිපිය මගින් සමෘද්ධි බැංකු හා බැංකු සමිති ලියාපදිංචි කිරිමට අදාල උපදෙස් හා මඟපෙන්වීම් ලබාදි ඇත. ඒ අනුව බැංකු සහ බැංකු සමිති ලියාපදිංචි කිරිමට අදාල ලියාපදිංචි ගාස්තු එවීමේදි පහත සඳහන් පරිදි චෙක්පත ලියා, මුදල් ප්‍රජාමූල බැංකු අංශයවෙත යොමු කරන ලෙස දන්වන අතර අදාල ගිණුම් සටහන් හා කේත අංක 2017/06 චක්‍රලේඛයේ සඳහන් කර ඇත.

**කළමණාකරු ලංකා බැංකුව බත්තරමුල්ල දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රජාමූල බැංකු අංශය ආයෝජන ගිණුම - ජංගම ගිණුම් අංක 3417925ට බැර පිණිස**

තවද එම චක්‍රලේඛයේ උපදෙස් පරිදි ප්‍රජාමූල බැංකුව විසින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියේ කොටස් මිලදි ගැනිමේදි පහත සඳහන් ගිණුම් විවෘත කර අදාල ගිණුම් සටහන් තැබිය යුතුය.

හර - කොටස් ගිණුම -ප්‍රජාමූල බැංකු සමිතිය (බැංකු මට්ටමේදි කේත අංකය 3006)
බැර - කොටස් ප්‍රාග්ධන ගිණුම (බැංකු සමිති මට්ටමේදි කේත අංකය 9002)

සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය විසින් මෙම කොටස් මිලදි ගැනිමට අදාලව ලිපියක් ප්‍රජාමූල බැංකුව වෙත ලබාදිය යුතු අතර, කොටස් සම්බන්ධ විස්තර සටහන් කිරිමට ලෙජරයක් භාවිතා කල යුතුය.

* **<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ සහ බැංකු සමිතියේ පාලක මණ්ඩල හා විධායක කමිටු සාමාජිකයින් ඉල්ලා අස්වීම හා නැවත පත්වීම.</u>**

ප්‍රජාමූල බැංකුවේ පාලක මණ්ඩල සභිකයෙකුට කළමණාකරු අමතා ඉදිරිපත් කරණු ලබන ලිපියක් මඟින් ඉල්ලා අස්විය හැකි අතර පුරප්පාඩු වූ තනතුර සඳහා ඉල්ලා අස්වූ සභිකයා නියෝජනය කරන ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බැංකුවේ මහ සභාව නියෝජනය කිරිම සඳහා තෝරාගත් නියෝජිතයින්ගේ (10 දෙනාගේ) බහුතර කැමැත්ත අනුව අනුප්‍රාප්තිකයා පත්කල හැක.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya ,Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අධ්‍යක්ෂ (මානව සම්පත්)<br>பணிப்பாளர் ( மனிதவளம்)<br>Director (Human Resource) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | **Hot Line: 011- 2887722** |
| E-mail- | dg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | finance@divineguma.gov.lk | **Hot Line:0112-885582** | |
| | | **Hot Line : 0112-889007** | | | |

ප්‍රජාමූල බැංකු සමිතියේ විධායක කමිටු සභාපතිවරයෙකුටද ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරු අමතා ඉදිරිපත් කරන ලිපියක් මඟින් ඉල්ලා අස්විය හැකි අතර, එසේ ඉල්ලා අස්වන අවස්ථාවේදි ඔහු ප්‍රජාමූල බැංකුවේ පාලක මණ්ඩල සාමාජිකත්වයෙන්ද ඉල්ලා අස්වූ බව සැලකේ. ඒ අනුව අදාල පුරප්පාඩුව සඳහා බැංකුවේ පාලක මණ්ඩලයට පත්වන නව සභිකයා බැංකු සමිතියේ විධායක කමිටුවට නම්කල යුතුය. බැංකුවේ පාලක මණ්ඩලය නියෝජනය කරන  සාමාජිකයෙකු ඔහු නියෝජනය කරන සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ සාමාජිකත්වය යම් කරුණකදි අහෝසිවූ විට එදින සිට පාලක මණ්ඩල සාමාජිකත්වය අහෝසි වූවාසේ සැලකිය යුතුය.

ප්‍රජාමූල බැංකු බල ප්‍රදේශයට ග්‍රාම නිලධාරි කොට්ඨාශ 15කට වඩා වැඩි ප්‍රමාණයක් අයත්ව තිබුනත් බැංකුවේ පාලක මණ්ඩලය සඳහා පත්කර ගත හැකි උපරිම සංඛ්‍යාව 15ක් වන අතර දැනට ගෙවනු ලබන පාලක මණ්ඩල දිමනා හෝ විධායක කමිටු දීමනාවල වෙනසක් සිදු  නොවන බව ද කාරුණිකව සඳහන් කරමි.

සමෘද්ධි ප්‍රජාමූල බැංකුවට සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය විසින් ණය නිර්දේශ කිරිමේදි ප්‍රජාමූල සංවිධානයේ මහ සභාවේ ආවරණ අනුමැතියට යටත්ව විධායක කමිටුවට ණය නිර්දේශ කල හැකි අතර එහිදි සභාපති හෝ ලේකම් අදාල ණය අයදුම් පත්‍රයේ නිර්දේශය සඳහා අත්සන් කල හැක. කෙසේ නමුත් සුවිශේෂ කරුණක් මුල්කොට ගෙන යම් ණය අයදුම් පත්‍රයක් ප්‍රජාමූල සංවිධානයේ මහ සභාවට යොමුකර සෘජු අනුමැතියට යටත්ව ඉදිරිපත් කරන ලෙස දැන්වීමට කළමණාකරුට හැකියාව ඇත.

සමෘද්ධි ප්‍රජාමූල බැංකු සහ බැංකු සමිති ලියාපදිංචි කිරිමට අදාල කරුණු පිළිබඳව වැඩිදුර පැහැදිලි කර ගැනිම සඳහා දුරකථන අංක 011-3054528 හෝ 011-2887469 ඇමතිය හැකි බව වැඩිදුරටත් කාරුණිකව සඳහන් කරමි.



කේ.කේ.එල්.චන්ද්‍රතිලක
අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පිටපත -
1. සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් - දැ.ගැ.පි. සහ අ.ක.ස
2. නීති නිලධාරි,එම්.පී.චන්ද්‍රලතා මෙනවිය. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.පි.සහ අ.ක.ස